## පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 183

### සෞඛ්‍ය අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද
වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ
හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

## *பாராளுமன்ற வெளியீட்டு தொடர் இல* - 183

### சுகாதார அமைச்சு

*பாராளுமன்ற அரச கணக்குகள் குழுவினால் முன் வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியல் கட்டளை இலக்கம் 119(4)இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்*

# Parliamentary Series Number – 183

## Ministry of Health

## Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119(4)

**පළමු කොටස - 69.00**

| | කාරක සභාව විසින් හඳුනාගනු ලැබූ දුර්වලතා | දුර්වලතා නිවැරදි කිරීම සඳහා ගනු ලැබූ පියවර හා වර්තමාන තත්ත්වය |
|---|---|---|
| 1 | හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබීම. | හානි හා පාඩු පිළිබඳ ලේඛණ යාවත්කාලීනව පවත්වාගෙන යාම සඳහා සියළු ආයතන ප්‍රධානීන් වෙත 01-39/2022 හා 2022.11.30 දිනැතිව "පාඩු හා අත්හැර දැමීම පිළිබඳ කටයුතු කිරීම" නමින් චක්‍රලේඛයක් නිකුත් කර අවශ්‍ය උපදෙස් ලබා දී ඇති අතර වර්තමානයේදී චක්‍රලේඛය පරිදි කටයුතු සිදු කරමින් පවතී. |
| 2 | විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබීම. | හැකි සෑම අවස්ථාවකදීම විගණන විමසුම් සඳහා මසක් ඇතුලත පිළිතුරු සැපයීමට කටයුතු කර ඇති අතර එසේ නොවන අවස්ථාවන්හිදී සාධාරණ කාලයක් තුල පිළිතුරු සපයා ඇත. |
| 3 | අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු ඉදිරිපත් කර නොතිබීම. | මේ වන විට අභ්‍යන්තර විගණන විමසුම් නිකුත් කරන විට එම විමසුම් සඳහා අනිවාර්යෙන්ම මසක් තුල පිළිතුරු ලබා දිය යුතු බව දන්වා ආවරණ ලිපියක් අදාල ආයතනය /රෝහල වෙත යොමු කරන අතර පළාත් මට්ටමින් පවත්වනු ලබන විගණන හා කළමනාකරණ රැස්වීම් වලදීද මෙතෙක් පිළිතුරු ලබා නොදුන් විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදෙන ලෙස අදාල රෝහල් අධ්‍යකෂවරුන් දැණුවත් කර කඩිනමින් පිළිතුරු ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. තවද අදාල කාලය ඇතුලත පිළිතුරු නොලැබුන හොත් සිහිකැඳවීම් ලිපි යොමු කිරීමටද කටයුතු කරනු ලැබේ. එබැවින් පැවති අදාල දුර්වලතාවය මේ වන විට නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |
| 4 | 2016.03.31 දිනැති අංක 5/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබීම. | එම දුර්වලතා මගහැර ගැනීම සඳහා සියළුම ආයතන දැණුවත් කිරීම සඳහා 01-35/2022 හා 2022.10.25 දිනැතිව භාණ්ඩ සමීක්ෂණය පිළිබඳ ඇති චක්‍රලේඛයක් නිකුත් කර ඇති අතර ඉදිරියේදී නියමිත දිනට අදාල සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.<br>එසේම 2021 වසර සඳහා වන භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණන අංශය වෙත ඉදිරිපත් කර ඇත. |
| 5 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ දුර්වලතා මගහැර ගැනීම සඳහා සියළුම ආයතන දැණුවත් කර ඇති අතර ඉදිරියේදී නියමිත දිනට අදාල |

| | | |
|---|---|---|
| | නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබීම. | අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. |
| 6 | වාහනයක් ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබීම. | දැනට ගර්හිත තත්ත්වයේ පවතින වාහන අපහරණය කිරීම සඳහා රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2015 ප්‍රකාරව අවශ්‍ය අපහරණ කමිටුව හා තක්සේරු කමිටුව පත්කර ඇති අතර අපහරණ තත්ත්වයේ පවතින වාහන අපහරණය සිදු කිරිම සඳහා කටයුතු කරමින් පවතී. |
| 7 | මු.රෙ.94(1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරි වූ ප්‍රතිපාදන සිමාව අනුමත සිමාවන් ඉක්මවා බැඳීම් ඇතිකර ගෙන තිබීම. | සියළු රෝහල් හා ආයතන දැනුවත් කර සිගාස් වැඩසටහන හා සමගාමීව බැරකම් හා බැඳීම් වාර්තා ඉදිරිපත් කිරීමට පියවර ගෙන ඇත.<br>2022 වර්ෂයේ සිට මෙම ගැටළු නිරාකරණය කර ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු යොදා ඇත. |
| 8 | වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතීම. | සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් රෝහල් හා ආයතන වල වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂයන් නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ගණකාධිකාරීවරුන් වෙත උපදෙස් ලබා දී ඇත. |
| 9 | සමාලෝචිත වර්ෂය අවසානයට මුදල් පොතේ පැවති ශේෂය අදාල චක්‍රලේඛ විධිවිධාන අනුව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට නියමිත දිනට ප්‍රේෂණය කර නොතිබීම. | සෞඛ්‍ය ආයතන හා රෝහල් මඟින් මුදල් වර්ෂය අවසානයේ ගිණුම් පියවා ඉතිරි මුදල් ප්‍රේෂණය කිරිමට පෙර, වියදම් වාර්තා සමඟ එම ශේෂ සැසඳීම හා දේශීය හා විදේශීය අක්මුදල් වෙන් වෙන්ව සැසඳීම සිදුකල යුතු බැවින් සෞඛ්‍ය අමාත්‍යාංශ මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට නියමිත දිනට ප්‍රේෂණය කිරීමට ප්‍රමාද වේ. මේ පිළිබඳ සෞඛ්‍ය ආයතන හා සියළුම රෝහල් වෙත නියමිත දිනට ගිණුම් පියවා ඉතිරි මුදල් ප්‍රේෂණය කිරිම සිදු කරන ලෙස දැනුවත් කර ඇත. |
| 10 | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්ත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබිම. | 2022 වසර සඳහා හා ඊට පෙර වසර සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ විවිධ අංශ වලින් ලබා ගන්නා ලද තත්ත්කාර්ය අතුරු අග්‍රිම සියල්ලම 2022.12.31 දිනට නිරවුල් කර ඇත.<br>මේ වන විට ඉකුත් වූ තත්ත්කාර්ය අතුරු අග්‍රිම නොපවතින අතර, තත්ත්කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිම වූ වහාම පියවිය යුතු බවට සහ ලබා ගන්නා ලද තත්ත්කාර්ය අතුරු අග්‍රිම අදාල කාර්යය සඳහා ලබා නොගන්නේ නම් වහාම නැවතත් මුදලින් පියවිය යුතු බව සැම අංශයක්ම වරින් වර දැනුවත් කර ඇති අතර, එය තත්ත්කාර්ය අතුරු අග්‍රිම ලබා ගන්නා අවස්ථාවේදීද එම අංශ වෙත යළි යලිත් දැනුවත් කරන බවද දන්වමි. |
| 11 | සමාලෝචිත වර්ෂය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු | සමාලෝචිත වර්ෂය වූ 2020 හි කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට නියමිතව |

| | | |
|---|---|---|
| | කාර්යසාධන වාර්තා නියමිත දිනට ඉදිරිපත් කර නොතිබීම. | තිබුනේ 2021 වර්ෂයේදීය. මෙම වාර්තාව 2021 මාර්තු මාසය අවසන් වනවිට කෙටුම්පත් කර තිබූ අතර එයට ඇතුලත් කල යුතු විගණන වාර්තාව නිකුත් කරන ලද්දේ 2021 ජූලි 30 දිනය.සිංහල භාෂාවෙන් නිකුත් කරන ලද පිටු 38 කින් යුත් එම වාර්තාව ඉංග්‍රීසි හා දමිළ භාෂාවෙන් පරිවර්තනය කිරීමට හා සම්පූර්ණ වාර්තාවේ පිටු ගණන අනුව මුද්‍රණය සඳහා මිල ගණන් කැඳවීම මෙන්ම අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම ප්‍රමාද විය. කොවිඩ් 19 වසංගතය පැවතීම හේතුවෙන් බොහෝ ගැටළු මධ්‍යයේ 2020 වර්ෂයේ කාර්යසාධන වාර්තාව 2021.11.13 දිනැති ලිපිය මඟින් 2021.11.20 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කෙරිණි.<br>2021 වර්ෂයේ කාර්යසාධන වාර්තාව ද ඉහත සඳහන් කරුණු හේතුවෙන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම ප්‍රමාද වූ අතර එය 2022.10.06 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කෙරිණි.<br>2020 හා 2021 යන වර්ෂ දෙකෙහිදීම කොවිඩ් 19 වසංගතය පැවතීම හේතුවෙන් සාමාන්‍ය පරිදි රාජකාරි කටයුතු පවත්වාගෙන යාමට නොහැකි වීමද ප්‍රමාදයට බොහෝ සේ හේතුවිය.<br>පෙර වර්ෂයන්හි සිදු වූ ප්‍රමාදයන් අවම කර ගනිමින් 2022 වර්ෂයේ කාර්යසාධන වාර්තාව නියමිත කාලය තුල පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය පියවර ගැනිමට කටයුතු කෙරේ. |

**දෙවැනි කොටස - 65.00**

| | **කාර්යසාධන ඇගයීම ප්‍රකාරව කාරක සභාව විසින් හඳුනාගනු ලැබූ දුර්වලතා** | **දුර්වලතා නිවැරදි කිරිම සඳහා ගනු ලැබූ පියවර හා වර්තමාන තත්ත්වය** |
|---|---|---|
| 1 | පුරවැසි/සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබීම. | පුරවැසි/සේවා ලාභී ප්‍රඥප්තිය සකස් කර ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශයේ සෑම අංශයක්ම නියෝජනය වන පරිදි කණ්ඩායමක් (Core Group) නම්කර ඇත.<br>ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සම්පත්දායකයන් ලවා පුහුණු සැසියක් පවත්වා ඇත.<br>අමාත්‍යාංශයේ සියළුම අංශ වෙතින් දත්ත/තොරතරු ලබාගෙන පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තියේ සිංහල භාෂා කෙටුම්පත සකස් කර ඇත. නැවත සියළුම අංශ වෙතින් අදාල වෙනස්කම් / තහවුරුකිරීම් ලබා ගැනීම සඳහා කටයුතු කරමින් පවතී.<br>අදාල තහවුරුවෙන් අනතුරුව භාෂාත්‍රයෙන් අත්පොත් සැකසීමටත්, වෙබ් අඩවියේ පල කිරීමටත් කටයුතු කරනු ඇත. |
| 2 | ආයතනයේ පුරවැසි/සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා | ඉහත පරිදි පුරවැසි/සේවා ලාභී ප්‍රඥප්තිය සකස් කිරීමෙන් අනතුරුව ඉහත කමිටුව මඟින් අධීක්ෂණය හා ඇගයීම් කටයුතු සිදු කිරීමට කටයුතු යොදා ඇත. |

| | | |
|---|---|---|
| | ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබීම. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 5/2008 හි සඳහන් ආදර්ශ ආකෘතිය අනුව පුරවැසි/සේවා ලාභී ප්‍රඥප්තිය සකස් කරන අතර, ඒ අනුව පැමිණිලි හා යෝජනා ලබා ගැනීමට නිලධාරීන් දෙදෙනෙකු නම් කිරීමට අපේක්ෂිතය. |
| 3 | රාජ්‍ය පරිපාලන විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබීම. | මානව සම්පත් ක්‍රමෝපායන සැලැස්මෙහි (HRM Strategic Master Plan 2020-2030) කෙටුම්පත ලෝක සෞඛ්‍ය සංවිධානය සමඟ එක්ව සකස්කර ඇති අතර මේ වන විට එහි අවසන් සංස්කරණ කටයුතු සිදු කරමින් පවතී. |
| 4 | සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් එක් සේවකයෙකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12 ක අවම පුහුණුවක් නියම කර නොතිබීම. | එක් සේවකයෙකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12 ක් වන අවම පුහුණුවක් ඉහතින් සඳහන් කර ඇති මානව සම්පත් ක්‍රමෝපායන සැලැස්මට ඇතුළත් කර ඇත. මුදල් ප්‍රතිපාදන ලැබෙන ආකාරයට එකී පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කල හැකි වේ. |
| 5 | සමස්ථ කාර්ය මණ්ඩලයම ඇතුළත්ව කාර්යසාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොතිබීම. | 2022 වර්ෂයේ සිට අමාත්‍යාංශයේ නිලධරයන්ගේ වාර්ෂික වැටුප් වර්ධක ලබාදීම සඳහා කාර්යසාධන ගිවිසුමකට එළඹ තිබීම අනිවාර්ය කිරීම (ඇමුණුම 01) හා එසේ කටයුතු කරන ලෙස අමාත්‍යාංශයේ සියළුම අංශ ප්‍රධානීන් වෙත දන්වා ඇත. (ඇමුණුම 02) |
| 6 | විගණකාධිපතිවරයා විසින් ඡේදවලින් පෙන්වා දී තිබූ අඩුපාඩු / දෝෂ නිවැරදි කරවාගෙන නොතිබීම. | ඡේදවලින් දක්වා තිබූ අඩුපාඩු හා දෝෂ සම්බන්ධයෙන් නිවැරදි කිරීම් සිදු කරන ලෙස අදාල අංශ භාර නිලධාරීන් වෙත දන්වා ඇති අතර ඒ සම්බන්ධ අධීක්ෂණ කටයුතු නොකඩවා කටයුතු සිදු කරනු ලැබේ. |

ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල,
සෞඛ්‍ය අමාත්‍ය.